**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## නිල ඇඳුම් සැපයීම සඳහා ටෙන්ඩර් අයදුම්පත

යොමු අංකය : **SPMC/P&P/UNI/II/J/2025 -2026**

අංක 11, සර් ජෝන් කොතලාවල මාවත
කඳවල වත්ත
රත්මලාන.
දුරකථන අංක ඃ 011-2637574 / 011-2635353

**<u>රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ</u> නිල ඇඳුම් සැපයීම සඳහා <u>ලංසු කැඳවීම</u>**

1. ලංසු ඉල්ලුම්කරුගේ නම :

2. ලංසු ඉල්ලුම්කරුගේ ලිපිනය :

3. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය සහ වෙනත් විස්තර (ඇත්නම්) :

4. දූරකථන අංකය :

5. සේවාවන් සඳහා ඉල්ලුම් කරනු ලබන ගාස්තු : **උපලේඛණ අංක 01 නිසි ලෙස පුරවා ලංසු ඉල්ලුම් පත සමග අමුණා එවිය යුතුය.**

මෙම ඉල්ලුම් පත්‍රයට අමුණා ඇති ලංසු කොන්දේසි අනුව ක්‍රියා කිරීමට එකඟ වන අතර, ලංසු ප්‍රදානය සම්බන්ධයෙන් සංස්ථා ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගැනීමට එකඟ වෙමි.

............................................................... දිනය : ..........................

ලංසුකරුගේ අත්සන හා රබර් මුද්‍රාව

**සැ.යු. අපැහැදිලි සහ ඉල්ලා ඇති සියලුම විස්තර සඳහන් නොකල ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

## ලංසු කරුවන්ට උපදෙස් හා අදාල කොන්දේසි
## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල ඇදුම් සැපයීම සඳහා ලංසු කැදවීම.

පහත දැක්වෙන කොන්දේසි වලට අනුකූලව 2026 ජනවාරි 01 දින සිට 2026 දෙසැම්බර් 31 දක්වා වූ වර්ෂයක කාලය සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල ඇදුම් සැපයීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

**1.** නිසි ලෙස සම්පූර්ණ කරනු ලැබූ ලංසු පත් කවරයක බහා පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ රත්මලානේ, කඳවලවත්තේ, සර් ජෝන් කොතලාවල මාවතේ, අංක 11 දරණ ස්ථානයේ, රා.ඖ.නි. සංස්ථාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ පුළුවන. ලංසු පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහල කෙළවරේ **"SPMC/P&P/UNI/II/J/2025 -2026"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**ලිපිනය ඃ ප්‍රසම්පාදන කමිටු සභාපති**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,**
**අංක 11, සර් ජෝන් කොතලාවල මාවත ,**
**කඳවලවත්ත,**

ලංසු පත් බාර ගන්නා අවසාන දිනය 2025 දෙසැම්බර් 23 දින පෙ.ව.10.00 දක්වා වන අතර එම වේලාවේම විවෘත කරනු ලැබේ.

## 2. ලංසු බැඳුම්කරය

**2.1** ලංසු බැඳුම්කරය වශයෙන් රා.ඖ.නි.සංස්ථාවේ (SPMC) ගිණුම් අංශයට රු.40,000/= ක මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සිය ලංසු අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කල යුතුය.

**2.2** ලංසු බැඳුම්කරය නොමැතිව ලැබෙන සියළුම ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒවා සම්බන්ධයෙන් තව දුරටත් සලකා බලනු නොලැබේ.

**2.3** ලංසු ප්‍රදානය කිරීමේ කටයුතු නිම කිරීමෙන් පසුව තෝරාගත් ලංසු කරුගේ ලංසු බැඳුම්කරය හැර අනෙකුත් ලංසු බැඳුම්කර අදාල ලංසු කරුවන් වෙත මුදාහරිනු ඇත. තෝරාගත් ටෙන්ඩර්කරුගේ ලංසු බැඳුම්කරය අදාල කාර්යසාධක ඇපකරය ඉදිරිපත් කර කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව මුදා හරිනු ලැබේ.

**2.4** තෝරාගත් ලංසුකරු විසින් ඉහත ලංසුව ප්‍රදානය කල දින සිට දින 14 ක් ඇතුලත කාර්යසාධක ඇපකරය ඉදිරිපත් කල යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ලංසු බැඳුම්කරය අහිමි කර දෙවනුව සුදුසුකම් ලැබූ ලංසුකරු වෙත ටෙන්ඩරය ලබාදීමට කටයුතු කරනු ඇත.

## 3. උප ලේඛණ මිල ගණන්

3.1 ලංසුකරුවන් විසින් මිල ගණන් , උප ලේඛණ අංක 01 සම්පූර්ණ කොට අත්සන් කල යුතුය.

3.2 ඉදිරිපත් කරන සියළුම මිල ගණන් පැහැදිලිව තීන්තෙන් ලිවීම හෝ යතුරුලියන කොට ඉලක්කමෙන් සහ අකුරින් ඉදිරිපත් කල යුතුය. ඉලක්කමෙන් සහ අකුරින් ලියන ලද මිල ගණන් වල කිසියම් වෙනසක් තිබුනහොත් අකුරින් ලියන ලද මිල ගණන් නිවැරදි ලෙස පිළිගැනීමට සිදු වේ.

3.3 සංශෝධන කිසිවක් සිදුකර ඇත්නම් ලංසුකරු ඒ සඳහා කෙටි අත්සන යෙදිය යුතුය. එසේ නොකොට ඉදිරිපත් කරනු ලබන මිල ගණන් අවිධිමත් ඒවා ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

## 4. කාර්ය සාධන බැඳුම් ඇපකරය

4.1 තෝරා ගත් ලංසුකරු විසින් සේවාව ආරම්භ කිරීමට පෙර රු.100,000/-මුදලක් හෝ ඒ හා සමාන වටිනාකමින් යුතු පිළිගත් බැංකුවකින් ලබාගත් බැංකු අණකරයක් ඉදිරිපත් කල යුතුය. තෝරා ගත් ලංසුකරුගේ සේවා ඉටුකිරීම අසතුටුදායක බව ප්‍රසම්පාදන මණ්ඩලයට පෙනී ගියහොත්, එම කාර්ය සාධක බැඳුම්කරය සංස්ථාව මගින් අයකර ගනු ලබන අතර, කොන්ත්‍රාත්තුවද අවසන් කරනු ඇත.

4.2 ඉහත කාර්ය සාධන බැඳුම්කරය 2026 දෙසැම්බර් 31 දක්වා වලංගු විය යුතුය.

## 5. දැනුම් දීම

5.1 ලංසුව පිළිගැනීමේ ලිපිය තෝරාගත් ලංසුකරු වෙත ඔහු විසින් ටෙන්ඩර් අයදුම් පත්‍රයේ දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබේ.

## 6. <u>පොදු කොන්දේසි</u>

**6.1** කොන්ත්‍රාත්තුව වෙනත් උප කොන්ත්‍රාත්කරුවෙකුට පැවරිය නොහැක

**6.2** නිල ඇදුම් සැපයීම සඳහා සේවකයන්ගේ මිමි ලබාගැනීමට SPMC ආයතනයට පැමිණිය යුතු අතර ඉන් උපරිම සති 3 කට පසු එම නිල ඇදුම් මසා නිම කොට ආයතනය වෙත ලබාදිය යුතුය

**6.3** මේ සම්බන්ධව පෙර ලංසු හමුවක් පවත්වන අතර ඒ සඳහා ලංසු අපේක්ෂකයන්ගේ සහභාගීත්වය අනිවාර්ය වේ.

**6.4** මෙම නිල ඇදුම් පිරිසිදු කරනු ලබන්නේ රෙදි සෝදන යන්ත්‍ර මගින් බැවින් එම යන්ත්‍ර වලට ඔරොත්තු දෙන පරිදි අමුද්‍රව්‍ය යෙදවිය යුතුය. (සිපරස්, බොත්තම්, හක්)

## <u>ලංසු පත්‍රය සමග ඉදිරිපත් කලයුතු විස්තර</u>

පහත සඳහන් විස්තර හා ලිපි ලේඛණ ලංසු පත්‍රය සමග ඉදිරිපත් කලයුතුය.

**01.** **යථා පරිදි සම්පූර්ණ කර අත්සන් කරන ලද ලංසු අයදුම් පත්‍රය.**
**02.** **යථා පරිදි අත්සන් කරන ලද පොදු කොන්දේසි.**
**03.** **යථා පරිදි අත්සන් කරන ලද මිළ ගණන් උපලේඛණය.**
**04.** **ලංසු බැඳුම්කරය.**
**05.** **පසුගිය වර්ෂවල සේවා සැපයූ ආයතන හා ඒවා සහතිකකිරීම සඳහා සේවා සහතික**
**06.** **දැනට සේවා සපයන අනෙකුත් ආයතය.**
**07.** **ආයතනය සතු සේවක සංඛ්‍යාව හා වගකිවයුතු ඉහල කළමණාකාරීත්වයේ සම්පූර්ණ තොරතුරු.**
**08.** **ව්‍යාපාරයේ ලියාපදිංචි සහතික හා අයිතිකරුවන්ගේ විස්තර.**

මේ පිළිබඳ වැඩිදුර විස්තර අවශ්‍ය වෙතොත් රා.ඖ.නි. සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සැලසුම් හා ප්‍රසම්පාදන වෙතින් වැඩ කරන දිනයන්හිදී පෙ.ව.9.00 සිට ප.ව.4.00 දක්වා දුරකථන අංක 011-2637574 / 011-2635353 මගින් විමසා දැන ගත හැක.

ලංසුවේ ඉහත කොන්දේසිවලට අනුව ක්‍රියාකිරීමට මම එකඟ වෙමි.

ලිපිනය ඃ

....... .................. ......................................
දිනය ලංසුකරුගේ අත්සන සහ තනතුර

**උපලේඛණ අංක 01**

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

**නිල ඇඳුම් සැපයීම සඳහා ටෙන්ඩර් අයදුම්පත**
යොමු අංකය : **SPMC/P&P/UNI/II/J/2025 -2026**

| අනු අංක | අයිතමයන්ගේ විස්තරය | ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් අමුද්‍රව්‍ය සමග | |
|---|---|---|---|
| | | මිළ ගණන් ඉලක්කමෙන් | මිළ ගණන් අකුරින් |
| 01 | අළු පැහැති දිග කලිසම (Material- Cotton Twill) | | |
| 02 | අළු පැහැති කමිසය ( Material- Cotton Twill) | | |
| 03 | අළු පැහැති හිස්වැසුම ( Material- Cotton Twill) | | |
| 04 | සුදු පැහැති කාන්තා දිග කලිසම ( Material- Hi-sofy) | | |
| 05 | සුදු පැහැති කාන්තා කබාය ( Material- Hi-sofy) | | |
| 06 | සුදු පැහැති ජම්පරය සමග අරාබි තොප්පිය ( Material- Hi-sofy) | | |
| 07 | සුදු පැහැති කාන්තා බේකරි තොප්පිය ( Material- Hi-sofy) | | |

……. ……………..……
දිනය

………………………………….
ලංසුකරුගේ අත්සන සහ තනතුර